

## චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ

# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව
# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

---

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

கடல்சார் கடல் அறிவியல் தேசிய நிறுவனம் தேசிய நீர்வள
ஆராய்ச்சி அபிவிருத்தி முகாமை

මෙම නිර් දේශය වලංගු වන්නේ නිකුත් කල දින සිට දින 3-5 දක්වා පමණි. அறிவுரை வழங்கப்பட்டதிலிருந்து 3-5 நாட்களுக்கு மட்டுமே செல்லுபடியாகும்

පන්න ගැඹුර බඹ වලින් දක්වා ඇත ஆழம் பாகத்தில்



බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථනය

## ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

නිකුත්කල දිනය பிரசுரிக்கப்பட்ட திகதி :

**2022-11-18**

| දේශාංශ நெட்டாங்கு | | | අක්ෂාංශ அகலாங்கு | | | ගැඹුර ஆழம் |
|---|---|---|---|---|---|---|
| අංශක பாகை | මිනිත්තු கலை | | අංශක பாகை | මිනිත්තු கலை | | බඹ பாகம் |
| 85 | 59 | E | 12 | 19 | N | 43 |
| 82 | 29 | E | 10 | 16 | N | 38 |
| 81 | 46 | E | 10 | 38 | N | 28 |
| 67 | 52 | E | 0 | 2 | N | 44 |
| 82 | 35 | E | 9 | 35 | N | 32 |
| 78 | 3 | E | 2 | 45 | N | 38 |
| 63 | 17 | E | 6 | 22 | N | 39 |
| 61 | 59 | E | 4 | 39 | N | 40 |
| 61 | 17 | E | 5 | 25 | N | 42 |
| 62 | 31 | E | 8 | 44 | N | 43 |
| 59 | 47 | E | 6 | 25 | N | 41 |

0112 520193

WhatsApp 070 272 3990

Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

**බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය**
**උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශය සඳහා**
**(2022 නොවැම්බර් මස 18 දින පෙ.ව. 07.00 ට, ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)**

**දිවයින වටා වන මුහුදු ප්‍රදේශ**

**වැසි තත්ත්වය:**
කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.
**සුළඟ:**
දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං උතුරු දෙසින් හමා එයි. සුළගේ වේගය පැ.කි.මී. (25-35) පමණ වේ. කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (45-50)** පමණ දක්වා වැඩිවිය හැක. සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. 40** පමණ දක්වා වැඩිවිය හැක.
**මුහුදේ ස්වභාවය:**
කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළුවේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළුවේ.

**බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය**

**ගිනිකොණ දිග බෙංගාල බොක්ක සහ ඊට යාබද උතුරු අන්දමන් සාගරය ආශ්‍රිතව පවතින අඩු පීඩන කලාපය නොවැම්බර් මස 19 වන දින වනවිට පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී, බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් 2022 නොවැම්බර් මස 20 සහ 21 දින වනවිට ශ්‍රී ලංකාවේ උතුරු වෙරළට ආසන්නව ගමන් කිරීමේ වැඩි හැකියාවක් පවතී.**

**එබැවින් කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවලට සහ බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයට, අද (18) දිනයේ සිට 2022 නොවැම්බර් 21 වන දින දක්වා යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

**කාලගුණික තත්ත්වය:**

07N-18N, 80E-100E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
00-07N, 80E-100E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

04N-20N, 80E-100E : වාමාවර්තව භ්‍රමණය වන සුළං / පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී. (50-60).
00-04N, 80E-95E : බස්නාහිර සිට නිරිත දක්වා දිශාවලින් / පැ.කි.මී. (25-35); විටින් විට පැ.කි.මී. (40-50).
සෙසු මුහුදු ප්‍රදේශ : නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී.(20-30).

**මුහුදේ ස්වභාවය:**

04N-20N, 80E-100E : තරමක් රළු සිට රළු.
00-04N, 80E-95E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවය සිට මඳ වශයෙන් රළු.

අරාබි මුහුද

**කාලගුණික තත්ත්වය:**

02N-10N, 60E-75E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
00-06N, 75E-80E : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ප්‍රධාන වශයෙන් වැසි රහිත.

**සුළං තත්ත්වය:**

06N-10N, 77E-80E : ඊසාන සිට වයඹ දක්වා දිශාවලින් / පැ.කි.මී. (25-35); විටින් විට පැ.කි.මී. (40-50).
00-06N, 60E-80E : නිරිත සිට වයඹ දක්වා දිශාවලින් / පැ.කි.මී. (20-30); විටින් විට පැ.කි.මී. (40-45).
10N-20N, 60E-75E : ඊසාන දෙසින් / පැ.කි.මී. (25-35); විටින් විට පැ.කි.මී. 40.
සෙසු මුහුදු ප්‍රදේශ : වාමාවර්තව භ්‍රමණය වන සුළං / පැ.කි.මී.(20-30).

**මුහුදේ ස්වභාවය:**

06N-10N, 77E-80E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු; විටින් විට රළු දක්වා.
00-06N, 60E-80E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු.
10N-20N, 60E-75E : මඳ වශයෙන් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවය සිට මඳ වශයෙන් රළු.

දකුණු ඉන්දියානු සාගරය

**කාලගුණික තත්ත්වය:**

00-10S, 85E-100E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
00-07S, 65E-85E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

00-04S, 70E-100E : බස්නාහිර සිට නිරිත දක්වා දිශාවලින් / පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී.50.
04S-10S, 63E-93E : ගිනිකොණ දෙසින් / පැ.කි.මී. (25-35).
සෙසු මුහුදු ප්‍රදේශ : දක්ෂිණාවර්තව භ්‍රමණය වන සුළං / පැ.කි.මී. (15-30).

**මුහුදේ ස්වභාවය:**

00-04S, 70E-100E : මඳ වශයෙන් රළු, විටින් විට තරමක් රළු.
04S-10S, 63E-93E : මඳ වශයෙන් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවය සිට මඳ වශයෙන් රළු.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව